**බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.3,750,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | උපලේඛනය ලැබුණු පසු බිල් කිරීමට කටයුතු කරන බව සහ ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයන්ට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 1,253,805 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් ගිණුම්ගත කර ඇති බවත්, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගත නොවූ කර්මාන්ත 04 ක එකතු වටිනාකම රු. 26,475,997 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | කර්මාන්ත ණය හිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ව්‍යාපෘති 02 ක් සඳහා වර්ෂය අවසානය වන විට ඇස්තමේන්තුව අනුමත නොවීම හේතුවෙන් ගිවිසුම්ගත නොවුනද ණය හිමි ප්‍රතිපාදන වෙන් කළ බවත්, හංවතුරෙන් අපදාවට ලක් ජනතාවට සහන සැලසීම සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදලින් තවදුරටත් කර්මාන්ත ඉටු කිරීමටත්, දුම්රිය මාර්ග ව්‍යාපෘතිය නිසා අබලන් වූ මාර්ග සංවර්ධනය කිරීම සඳහාත් ණය හිමි වෙන් කලෙමි. |

(ආ) **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළ එකතුව රු. 112,352,590 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 809,322 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙනස පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 284,753,737 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යන බව සහ විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරියේදී ඉදිරිපත් කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශය සකස් කර ඉදිරියේදී එවීමට කටයුතු කරමි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
----------------------------

| | | | | |
|---|---|---|---|---|
| i. | මු.රෙ. 134(3) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| ii. | මු.රෙ. 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ඇ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජනවාරි 30 දිනැති අංක PFD / RED / COPA / 2019 / 01 දරණ ලිපියේ 04 ඡේදය | වාර්ෂිකව කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා වාර්ෂිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා /පපාකො / 2010 / 01 දරණ චක්‍රලේඛයේ 04 ඡේදය | සභාව සතු කඩ කාමර 07 කට අදාළ රු.1,273,000 ක් වූ එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟ මුදලින් රු. 475,000 ක් අයකරගෙන ඇති බවත්, රු. 438,000 ක් සම්බන්ධයෙන් විමර්ශන නිලධාරී පරීක්ෂණයක් සිදු කරන බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**
---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,882,989 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 16,090,076 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,101,840 | 2,898,745 | 1,998,681 | 1,365,625 | 1,991,590 | 1,977,986 | 1,156,276 | 1,724,741 |
| කුලී | 11,958,458 | 9,600,147 | 10,088,708 | 1,955,013 | 9,458,458 | 8,512,046 | 8,256,408 | 1,610,164 |
| බලපත්‍ර ගාස්තු | 2,863,850 | 1,115,687 | 1,544,292 | 178,900 | 3,616,050 | 2,175,027 | 2,113,989 | 90,600 |
| වෙනත් ආදායම් | 25,333,650 | 17,932,391 | 1,461,860 | 68,138,049 | 88,890,716 | 71,866,661 | 57,241,166 | 34,114,397 |
| එකතුව | 43,257,798 | 31,546,970 | 15,093,541 | 71,637,586 | 103,956,814 | 84,531,720 | 68,767,839== | 37,539,902 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු වරිපනම් බදු රු. 1,344,525 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර හා වර්ෂ 05 ට වැඩි ශේෂයන් පිළිවෙලින් රු. 409,137 ක් හා රු. 286,930 ක් විය. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු. 144,644 ක් අයකර ගෙන ඇති බවත්, ඉදිරියේදී දේපළ තහනම් කිරීමට යොමු වී මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු කඩ කාමර කුලී රු. 582,665 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 02 ත් 05 ත් අතර ශේෂය රු. 202,710 ක් විය. | හිඟ කඩ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ කඩ කුලියෙන් රු. 392,072 ක් ලැබී ඇති බව හා රු.156,160 ක මුදලක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත යැවීමට තීරණය වී ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු පොළ බදු කුලී හා වාහන කුලී පිළිවෙලින් රු. 255,459 ක් හා රු. 1,116,889 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිග කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | වාහන කුලී හිගයෙන් රු. 70,250 ක් ලැබී ඇති බවත්, වසර ගණනාවක සිට පවතින හිග ශේෂ පිළිබඳ සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරන බවත්, පොළ බදු කුලී සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු පිළිවෙලින් රු. 170,300 ක් හා රු. 2,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ව්‍යාපාර බදු ශේෂය තුළ වර්ෂ 02 ත් වර්ෂ 03 ත් අතර හිග හිටි ශේෂය රු. 51,500 ක් විය. | හිග බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ව්‍යාපාර බදු හිගයෙන් රු. 78,000 ක් අයකර ගෙන ඇති බවත්, ඉතිරි හිගය සඳහා නඩු පැවරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව දන්වමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 766,291 ක් හා රු. 65,751,897 ක් විය. | හිග උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මුද්දර ගාස්තු හිගයෙන් රු. 7,800,000 ක් අය වී ඇති බවත්, ඉතිරි මුදල් හා උසාවි දඩ මුදල් ගෙන්වා ගැනීමට ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ වූ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කරුණු 29 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | සභාව විසින් කරුණු 29 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ඇති බව දන්වමි. |

(ආ) **අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේදී ආරම්භ කල කොම්පෝස්ට් ව්‍යාපෘතියේ අපජලය පිරිපහදු පද්ධතිය සංවර්ධනය කිරීමේ කර්තව්‍යය සඳහා රු. 202,400 ක් වැය කලත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. තවද එම ඉදි කිරීමට යොදාගත් කම්බි ප්‍රමිතියෙන් බැහැර වීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වීමෙන් අත්හැර දමා තිබුණි. | ශක්‍යතා අධ්‍යනයකින් පසුව ව්‍යාපෘති ආරම්භ කළ යුතුවේ. | පිළිගනිමි. |

(ඇ) **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු. 8,500,000 ක් වූ සංවර්ධන යෝජනා ක්‍රම 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනයෙහි ඇතුළත් කර ඇති සංවර්ධන යෝජනා ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | මාර්ග කිහිපයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සංවර්ධනය කර ඇති බවත්, සභාවේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන එක් යෝජනාවක් පමණක් ක්‍රියාත්මක කළ බවත්, දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන සැලසුම මේ වන විට සකස් කරමින් පවතින බවත්, සකස් කිරීම සඳහා නිලධාරීන්ට පුහුණුවක් නොලැබීම මත සකස් කිරීම ප්‍රමාද වූ බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ වාහන 06 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන සඳහා වාර්ෂිකව ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | එක් වාහනයක් සඳහා ලීසිං පහසුකමක් ඇති බවත්, වාහනයක් අපහරණය කිරීමටත්, වාහන 02 ක් අළුත්වැඩියා කිරීමෙන් පසුව පවරා ගැනීමට සහ ඉතිරි වාහන පවරා ගැනීමට කටයුතු කරන බවත්, පවරා ගැනීමෙන් පසුව ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | මිලදී ගැනීමේ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව මිලදී ගත් රු. 720,000 ක් වටිනා කළමනාකරණ තොරතුරු පද්ධතීන් 04 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අක්‍රීයව තිබුණි. | කළමනාකරණ තොරතුරු පද්ධතිය උපයෝජන කිරීමට කටයුතු කළ යුතුවේ. | ආයතනයේ කාර්යය සාධනය ඉහළ නංවා ගැනීම සඳහා සූරියවැව ප්‍රාදේශීය සභාවේ මිලදී ගැනීම පදනම් කර ගෙන හම්බන්තොට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව මෙම තොරතුරු පද්ධතිය මිලදී ගත් බවත්, දැනට මෙම පද්ධති ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආයතනයේ සියලු දත්ත හා තොරතුරු සේවා සපයන්නාගේ ස(ර්)වර් පරිගණකය තුළ ගබඩා කර තිබීමෙන් සභාවේ දත්ත හා තොරතුරු වල ආරක්ෂාව, රහස්‍යභාවය හා නිරවද්‍යතාවය සම්බන්ධයෙන් අවදානමක් පැවතුණි. | සභාවේ තොරතුරු ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමසා මේ සම්බන්ධව කටයුතු කරමි. |
| (ඈ) | 2014 වර්ෂයේදී පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබූ කොඩි කණු 600 න් බාහිර පාර්ශවයකට කොඩි කණු 279 ක් නිකුත් කර තිබුණද එම කොඩි කණු නැවත සභාවට ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2014 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ විහාරස්ථාන, පාසල් කීපයකටද, පොදු ස්ථාන කීපයකටද මෙම කොඩි කණු නිකුත් කර ඇති බවත්, ඉදිරියේදී ගබඩා ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා
-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ----------------------------- |
| i. | ප්‍රාදේශීය සභාවේ අනුමත හා තථ්‍ය සේවක සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 04 ක් හා අතිරික්තතා 22 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කනිෂ්ඨ කාර්යය මණ්ඩල පුරප්පාඩු බඳවා ගැනීම භාණ්ඩාගාර ලේකම් සහ මුදල් ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක DHS / Cir / 2020 චක්‍රලේඛයට අනුව තාවකාලිකව අත්හිටුවා ඇති අතර, පසුව බඳවා ගැනීමට කටයුතු කරන බව සහ දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු බඳවා ගැනීමට දැනුම් දී ඇත. අතිරික්ත නිලධාරියා දැනට ස්ථාන මාරු වී ඇති බව දන්වමි. |
| ii. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් හා මානව සම්පත් සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුවේ. | 2019 දෙසැම්බර් 20 දින පැවති මහා සභාවේදී මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුමත වී ඇති බව දන්වමි. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 781,689 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට අදාළ පුද්ගලයින්ගෙන් මාසිකව මුදල් අයවෙමින් පවතින බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතු වටිනාකම රු. 37,078,994 ක් වූ සභාව සතු වාහන 13 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | එක් වාහනයක් සඳහා ලීසිං පහසුකමක් ඇති බවත්, වාහනයක් අපහරණය කිරීමටත්, වාහන 02 ක් අළුත්වැඩියා කිරීමෙන් පසුව පවරා ගැනීමටත්, ඉතිරි වාහන පවරා ගැනීමට කටයුතු කරන බවත්, පවරා ගැනීමෙන් පසුව ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරමි. |

### 3.4.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ කුට්ටිගල් නිෂ්පාදන වැඩපලෙහි හා කොහුමෝල් කර්මාන්තයට අයත් මෝටර් 02 ක්, ලීටර් 1000 බැරලයක් සහ කුට්ටිගල් නිෂ්පාදිත යන්ත්‍රය වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | කොහු නිෂ්පාදය නතර කළ බැවින් මෝටර් 02 ක පුවක්දණ්ඩාව ගබඩාවේ ඇති බවත්, කුට්ටිගල් යන්ත්‍රයෙන් නිෂ්පාදනය කරන ගල් තත්ත්ව පරීක්ෂණය අසමත් වන බැවින් කුට්ටිගල් අලෙවි කිරීමට නොහැකි නිසා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකළ බව දන්වමි. |

### 3.4.3 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු. 4,455,200 ක් වූ සභාව සතු වාහන 03 ක් වර්ෂ ගණනාවක සිට භාවිතයට නොගෙන තිබෙන අතර ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාවනයෙන් ඉවත් කළ වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | කැබ් රථයක් අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බැවින් ලියාපදිංචි අයිතිය ඇති ආයතනයට පවරා දීමටත්, තවත් කැබ් රථයක් අළුත්වැඩියා කර ගැනීමට කටයුතු කරන අතර, ඉතිරි කැබ් රථය අළුත්වැඩියා කර ගත හැකිද යන්න පරීක්ෂා කර ඒ අනුව ඉදිරියේදී කටයුතු කරමි. |